

# මහින්ද රාජපක්ෂ VS චන්ද්‍රිකා & රනිල්

රටේත් ජනතාවගේත් අනාගතය තීන්දු කෙරෙන පස්වැනි ජනාධිපතිවරණයට ඇත්තේ තව දින කිහිපයක් පමණකි. මේ වන විට ප්‍රධාන අපේක්ෂකයන් දෙදෙනාගේ ම මැතිවරණ ප්‍රචාරක කටයුතු තියුණු වී තිබේ. ඇත්ත වශයෙන් ම කියන්නේ නම්, ප්‍රචාරක ව්‍යාපාරය වේගවත් හා තියුණු වී ඇත්තේ රනිල් වික්‍රමසිංහ මහතාගේ පමණකි. නිදහස් සන්ධාන අපේක්ෂක මහින්ද රාජපක්ෂ ජනතාව අතර ඉදිරියෙන් සිටිය ද ප්‍රචාර ව්‍යාපාරය හා වී මත විමසුම් අතර ඉදිරියෙන් සිටින්නේ එක්සත් ජාතික පක්ෂ අපේක්ෂක රනිල් වික්‍රමසිංහයි. රනිල් වික්‍රමසිංහට එම හැකියාව ලැබී ඇත්තේ ඔහුට ඇති මුදල් බලය නිසා ය. මුදලාලිලා බොහොමයක් රනිල් වික්‍රමසිංහට කෝටි ගණනින් මුදල් වැය කරන්නේ මහින්ද රාජපක්ෂ පරාජය කිරීමට වඩා ඔහුගේ ප්‍රධාන ශක්තියක් වී ඇති ජවිපෙ පරාද කිරීමට ය. පසුගිය දිනවල ශ්‍රී ලංකාවේ ප්‍රකට බුකි ජාවාරම්කරුවකු වන තිලංග සුමතිපාල ද ප්‍රසිද්ධියේ ම එක්සත් ජාතික පක්ෂයට එක් විය. දැන් ඔහු අනුරාධපුරයේ එජාප දිස්ත්‍රික් සංවිධායකවරයා ය.

එක්සත් ජාතික පක්ෂය පෞද්ගලික මෙන් ම රාජ්‍ය විද්‍යුත් මාධ්‍ය ඔස්සේ ද එක පිට එක සංවර්ධනාත්මක මෙන් ම පුචාරාත්මක දැන්වීම් ද පල කරමින් සිටී. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවට පමණක් ඒ සඳහා ගෙවා ඇති මුදල රුපියල් ලක්ෂ 420 කි. රනිල් වික්‍රමසිංහ මහතාගේ මුදල් ගෙවා කෙරෙන ප්‍රචාරක ව්‍යාපාරය සේ ම මුදල් නොගෙවා පෞද්ගලික මාධ්‍ය ඔස්සේ සිදු කෙරෙන ප්‍රචාරය ද ඉතා පුළුල්වත්, විධිමත් වත් සිදු කෙරෙමින් පවතී.

ජනාධිපතිවරණයෙන් ජය ගන්නේ කවු දැයි යනුවෙන් සිරස රූපවාහිනියේ හා සිරස ගුවන් විදුලියෙන් පවත්වන SMS මත විමසුමෙන් ද ඉදිරියෙන් සිටින්නේ රනිල් වික්‍රමසිංහ මහතා ය. එහි ප්‍රතිඵලවල නිරවද්‍ය භාවය කෙසේ වුව ද දැන් විරුද්ධ පාර්ශ්වය තුළ රනිල් වික්‍රමසිංහ හැඳින්වෙන්නේ SMS ජනාධිපති' ලෙස ය. මහින්ද රාජපක්ෂට සිය ජනාධිපතිවරණ සටන තුළ රනිල් සමඟ මෙම ප්‍රචාරක අභියෝගයට පමණක් නොව, තම පක්ෂ නායිකාවගේ හා ඇගේ සොහොයුරා ඇතුළු කිහිප දෙනකු විසින් ඔහුව පරාද කිරීමට ගෙන යන වැඩපිළිවෙළ පරාජය කිරීමේ අභියෝගයකට ද මුහුණ දීමට තිබේ. අප මීට පෙර ද මේ බව සඳහන් කොට ඇතත් මේ වන විට එම කුමන්ත්‍රණය වෙනස් ස්වරූපයක් ගෙන ඇත. දැන් ජනාධිපතිනිය මහින්ද රාජපක්ෂ විවේචනය කරන්නේ නැත. දැන් ඇය පහර ගසන්නේ ජනතා විමුක්ති පෙරමුණට ය.

කෙසේ වෙතත් මංගල සමරවීර, විමල් වීරවංශ, ශ්‍රීපති සූරියආරච්චි ඇතුළු කිහිප දෙනකුගේ කැපවීම මත ඉදිරියට යන මහින්ද රාජපක්ෂගේ මැතිවරණ ව්‍යාපාරයට ඔහුගේ ප්‍රතිපත්ති ප්‍රකාශය වූ 'මහින්ද චින්තන' එළිදැක්වීමත් සමඟ නව ජීවයක් ලැබී තිබේ. රනිල් වික්‍රමසිංහගේ 'ජනතාවගේ න්‍යාය' පත්‍රය සිල්ල කඩයක මිල දර්ශනයක් මෙන් වී තිබිය දී ඉතා පුළුල් සේ ම ස්ථිර වැඩපිළිවෙළක් ඉදිරිපත් කර තිබූ 'මහින්ද චින්තන' ජනතාව අතර ආකර්ෂනයක් හිමි කර ගෙන ඇත. එක්සත් ජාතික පක්ෂයට තවමත් එහි අඩංගු කරුණු විවේචනය කිරීමට හෝ නොහැකි වී තිබීමෙන් ම එහි සාර්ථකත්වය තේරුම් ගත හැක. එය විවේචනය කිරීමට ඔවුන්ට අවශ්‍ය අඩු ම කුඩුම සපයන්නේ ජනාධිපතිනිය හා අනුර බණ්ඩාරනායක අමාත්‍යවරයායි. මෙම ප්‍රතිපත්ති ප්‍රකාශයේ අඩංගු දේ තමා නොදන්නා බවත්, එය දොරට වැඩීමේ අවස්ථාවට තමාට ආරාධනා නොකිරීම සම්බන්ධයෙනුත් ජනාධිපතිනිය දැඩි සේ උරණව සිටින බව එම සති අන්තයේ පුවත්පත් වාර්තා කර තිබිණ. තමන් අග්‍රාමාත්‍ය අපේක්ෂකයා වුව ද මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය පිළිබඳ තමන් කිසිවක් නොදන්නා බව මේ දිනවල ඔහුගේ හොඳ ම පුවත්පත වී තිබෙන 'ලංකාදීපයට' අනුර බණ්ඩාරනායක මහතා ප්‍රකාශ කොට තිබිණ. 'මහින්ද චින්තන' වැඩපිළිවෙළක් වශයෙන් කොතරම් අනර්ඝ වුව ද එය පොතකට සීමා වී තිබෙන තාක් කල් මහින්ද රාජපක්ෂගේ ජය නියත කරවන ආයුධයක් වන්නේ නැත. මේ බව තේරුම් නොගැනීම හෝ වෙනත් යම් හේතුවක් නිසා එය ජනතාව අතරට ගෙන ගොස් නොවැම්බර් 17 දායින් පසු ව යථාර්ථයක් බවට පත් කරවන බව අවධාරණය වී නැත. රාජ්‍ය මාධ්‍ය මහින්ද රාජපක්ෂ මහතාට පක්ෂපාතීව කටයුතු කරන බවට එක්සත් ජාතික පක්ෂය චෝදනා කළ ද සත්‍ය වන්නේ වෙනකකි. තවදුරටත් ජනමාධ්‍ය අමාත්‍ය ධුරය හොබවන්නේ ජනාධිපතිනියයි. එහි නියෝජ්‍ය අමාත්‍යවරයා වන්නේ ඇගේ සමීපතමයකු වී සිටින ඩිලාන් පෙරේරා මහතායි. ඒ නිසා රූපවාහිනීය, ගුවන් විදුලිය යන ලේක් හවුස් යන රාජ්‍ය මාධ්‍ය ආයතනවලින් මහින්ද රාජපක්ෂට හිතකර ප්‍රචාරයක් ලැබෙන්නේ නැත. මේ නිසා මෙම මාධ්‍ය ආයතන ඇතුළත ආරවුල් ඇති වී තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස පසුගිය දිනෙක රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ ජෙනරාල් නිශාන්ත රණතුංගගේ කාර්යාලයට අසූචි ප්‍රහාරයක් එල්ල වී තිබිණ. ඊට පසු දින ගුවන් විදුලි සංස්ථාවේ සභාපති හඩ්සන් සමරසිංහ සමඟ ඇතිවූ බහින් බස් වීමකින් පසු එහි ප්‍රවෘත්ති අධ්‍යක්ෂ රාජා කටුගම්පලට ආරක්ෂකයකු පහර දුන්නේ ය. පසුව එය සේ-




වකයන් හා ආරක්ෂන නිලධාරීන් අතර ගැටුමක් බවට පරිවර්තනය වූ අතර ඒ අවස්ථාවේ සභාපතිවරයාට ද සේ-වකයන්ගේ 'හූ' සංග්‍රහයක් ලැබිණ.
ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ආරම්භ කර තිබූ දේශපාලන වැඩසටහන් කීපයක් ද සභාපතිවරයා විසින් අත්හිටවනු ලැබ තිබේ. ලේක්හවුස් ආයතනයේ කර්තෘ මණ්ඩල අධ්‍යක්ෂවරයාව සිටි ජනාධිපතිනිය ඉවත් කර දැනට එහි උපදේශකයකු ලෙස කටයුතු කරන කරුණාරත්න පරණවිතාන මහින්ද රාජපක්ෂට වාසිදායක ලෙස ලියන ලිපි පල නොකිරීමට පාලනාධිකාරිය තීරණය කර තිබේ.
අනුර බණ්ඩාරනායක මහතා මේ දක්වා මහින්ද රාජපක්ෂ මහතාගේ කිසිඳු ප්‍රචාරක රැස්වීමකට සහභාගි වී නැත. ජනාධිපතිනිය සහභාගි වන්නේ 'ජනාධිපති හරසර' යනුවෙන් පළාත් මට්ටමින් පවත්වන රැස්වීම් කිහිපයකට පමණකි. ඒ සෑම අවස්ථාවක දී ම මහින්ද රාජපක්ෂ මහතාගේ ජය තහවුරු කරන ලෙස ජනතාවගෙන් ඉල්ලා සිටින ජනාධිපතිනිය ජනතා විමුක්ති පෙරමුණට ඇති පදමට බැණ බදින්නී ය.
ජනාධිපතිනිය මෙහි දී අවධාරණය කරමින් කියා සිටින්නේ අන්තවාදී පක්ෂවලින් ශ්‍රීලනිපය බේරාගත යුතු බව ය. එසේ වුව ද පරිණත දේශපාලනයක යෙදෙන ජවිපෙ කිසි විටෙක එම අවලාදයන්ට පිළිතුරු දෙන්නට යන්නේ නැත.
එසේ වුව ද, ශ්‍රීලනිපය ආරක්ෂා කර ගත යුතු බවට ජනාධිපතිනිය කරන යෝජනාව පිළිගැනීමට රනිල් වික්‍රමසිංහ මහතා ඉදිරිපත් ව සිටී. තමන් ජනාධිපති වූ පසු ශ්‍රීලනිප පාක්ෂිකයන්ව ආරක්ෂා කරන බවත්, ඔවුන් සමඟ සහයෝගයෙන් කටයුතු කරන බවත් රනිල් වික්‍රමසිංහ මහතා දිගින් දිගට ම ප්‍රකාශ කරමින් සිටී. රනිල් වික්‍රමසිංහ මහතාගේ මෙම ප්‍රකාශ හා ජනාධිපතිනිය කරනු ලබන ප්‍රකාශ අතර කිසියම් සමානාත්මතාවක් දක්නට තිබීම පුදුමාකාරය. රනිල් වික්‍රමසිංහ

29 පිටට

